For More Government Jobs, Gazette, Past Papers and Application forms
Please Visit : **www.tamilguru.lk** | Contact us: **tamilguru.lk@gmail.com**



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ II වන පෙළ ජේලර්වරුන් හා II වන පෙළ පුනරුත්ථාපන නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014 (2015)

## (02) සාමාන්‍ය දැනීම

පැ. එකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



✳ **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**
**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.**

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

.....................................

**වැදගත් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **05** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය එකයි.**

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල්** හෝ **කළු** හෝ පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 11 | |
| 3 | 12 - 22 | |
| 4 | 23 - 36 | |
| 5 | 37 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

For More Government Jobs, Gazette, Past Papers and Application forms
Please Visit : www.tamilguru.lk | Contact us: tamilguru.lk@gmail.com



- අංක 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

1. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ කහ පැහැති පසුබිම් වර්ණයෙන් දැක්වෙන්නේ
   (1) බෞද්ධාගමට අයත් ජන කොටස් එකට ජීවත් වියයුතු බව ය.
   (2) සිංහල බෞද්ධ ජන කොටස් එකට ජීවත් වියයුතු බව ය.
   (3) සියලුම ආගමික ජනවර්ග එකට ජීවත් වියයුතු බව ය.
   (4) සියලුම සංස්කෘතීන්ට අයත් ජනවර්ග එකට ජීවත් වියයුතු බව ය. (………)

2. ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයට අදාළ අදහස් මුල් වරට තම කෘති මගින් ඉදිරිපත් කරන ලද දාර්ශනිකයන් දෙදෙනෙකු වන්නේ
   (1) ප්ලේටෝ සහ කෞටිල්‍ය ය. (2) ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ය.
   (3) ඇරිස්ටෝටල් සහ හෙරඩෝටස් ය. (4) කෞටිල්‍ය සහ හෙරඩෝටස් ය. (………)

3. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම සම්බන්ධයෙන් වර්තමානයේ වැදගත් සාධකයක් නොවන්නේ
   (1) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම ය. (2) ඉන්දියාවට ආසන්නයේ පිහිටීම ය.
   (3) මුහුදු සේද මාවතේ පිහිටීම ය. (4) ඉන්දියාවෙන් වෙන්ව දූපතක් ලෙස පිහිටීම ය. (………)

4. වර්තමාන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව
   (1) 160 කි. (2) 169 කි. (3) 196 කි. (4) 225 කි. (………)

5. රාජ්‍ය තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කර නොමැති දකුණු ආසියාවේ රට මින් කුමක් ද?
   (1) ඉන්දියාව (2) ශ්‍රී ලංකාව (3) නේපාලය (4) බංග්ලාදේශය (………)

6. ශ්‍රී ලංකාවේ ලෝක උරුම ලෙස පිළිගත් ස්ථාන අටක් ඇත. ලෝක උරුම ස්ථාන නම් කරනු ලබන එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනය මින් කුමක් ද?
   (1) UNICEF (2) UNDP (3) UNESCO (4) UNCTAD (………)

7. ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා වියුක්තිය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?
   (1) රැකියා වියුක්තිය 4% පමණ වේ.
   (2) පුරුෂයන්ට වඩා ස්ත්‍රීන් අතර රැකියා වියුක්තිය ඉහළ මට්ටමක ඇත.
   (3) ගම්බදට වඩා නගරබදව රැකියා වියුක්තිය ඉහළ මට්ටමක ඇත.
   (4) අ.පො.ස(උ.පෙ.) සමතුන් සහ උපාධිධාරීන් අතර රැකියා වියුක්තිය ඉහළ මට්ටමක ඇත. (………)

8. විධායක ජනාධිපති ක්‍රමය වසර 260 ක් තුළ කිසිදු සංශෝධනයක් නොමැතිව ක්‍රියාත්මක වන රට මින් කුමක් ද?
   (1) ඇමරිකා එක්සත් ජනපදය (2) ප්‍රංශය
   (3) ඉන්දියාව (4) දකුණු අප්‍රිකාව (………)

9. 2014 වර්ෂයේ ලොව ජීවත්වීමට සුදුසුම රට ලෙස නම් කරන ලද්දේ
   (1) ස්විඩනයයි. (2) ඔස්ට්‍රේලියාවයි. (3) නවසීලන්තයයි. (4) කැනඩාවයි. (………)

10. දකුණු ආසියානු රටවල් අතුරින් දීර්ඝම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇති රට වන්නේ
   (1) ඉන්දියාව ය. (2) ශ්‍රී ලංකාව ය. (3) බංග්ලාදේශය ය. (4) පාකිස්ථානය ය. (………)

11. නොගැළපෙන වරණය මින් කුමක් ද?
   (1) ජාතික ඖෂධ ප්‍රතිපත්තිය - දොස්තර නන්දදාස කෝදාගොඩ
   (2) ජල විදුලිබල නිෂ්පාදනය - ඩී. ජේ. විමලසුරේන්ද්‍ර
   (3) ශ්‍රී ලංකාවේ නව පාර්ලිමේන්තුව - ජෙෆ්රි බාවා
   (4) දේශපාලනය - ඇඩ්ලින් මොලමුරේ (………)

3803

12. අභ්‍යවකාශ තාක්ෂණයේ අපූර්ව මෙන්ම විශිෂ්ට ජයග්‍රහණයක් වන වල්ගා තරුවක (Comet) හිස මතට අභ්‍යවකාශ යානයක් ගොඩ බස්වන ලද්දේ
(1) ඇමරිකා එක්සත් ජනපදය විසිනි. (2) රුසියාව විසිනි.
(3) යුරෝපා සංගමය විසිනි. (4) චීනය විසිනි. (.........)

13. ලෝකයේ දිගම ගංගාව ලෙස සැලකෙන්නේ
(1) මිසිසිපි ය. (2) නයිල් ය. (3) ඇමර්සන් ය. (4) හොවැංහෝ ය. (.........)

14. ලෝක තෙල් මිල මෑතක සිට වාර්තාගත අයුරින් පහළ වැටෙමින් පවතී. මීට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?
(1) රුසියාවට විරුද්ධව ගනු ලැබූ ඇමරිකානු ක්‍රියා කලාපය
(2) නව තෙල් කෙත් සොයා ගැනීම
(3) ලෝක තෙල් ඉල්ලුම අඩුවීම
(4) තෙල් නිපදවන රටවල අර්බුද අඩුවීම (.........)

15. නව ඉන්දීය අගමැතිතුමා ඉහළම ප්‍රමුඛතාව ලබාදී ඇති ව්‍යාපෘතිය වන්නේ
(1) ජනතාවගේ දුප්පත්කම තුරන් කිරීම ය. (2) ත්‍රස්තවාදය සහමුලින්ම පරාජය කිරීම ය.
(3) අපිරිසිදු බව රටින් තුරන් කිරීම ය. (4) චීනය සමග සබඳතා වර්ධනය කර ගැනීම ය. (.........)

16. වර්තමානයේ පෘථිවිවාසීන් මුහුණ දෙන බරපතලම ප්‍රශ්නය වන්නේ
(1) ආහාර හිඟවීමයි. (2) ත්‍රස්තවාදය ව්‍යාප්තවීමයි.
(3) වායුගෝලීය උෂ්ණත්වය ඉහළයාමයි. (4) ජන සංඛ්‍යාව ඉහළයාමයි. (.........)

17. 1876 දී ශ්‍රී ලංකාවේ පළමු රබර් පැළය සිටුවන ලද්දේ
(1) පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ය. (2) සිංහරාජ වන රක්ෂිතයේ ය.
(3) අගලවත්ත රබර් පර්යේෂණ ආයතනයේ ය. (4) හක්ගල උද්භිද උද්‍යානයේ ය. (.........)

18. වර්තමානයේ ලෝකයේ බොහෝ රටවල ක්‍රියාත්මක වන පශ්චාත් ලිබරල්වාදයේ ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?
(1) රජය සියලු ආර්ථික කටයුතුවලින් ඉවත්වීම
(2) පෞද්ගලික දේපොළ තබාගැනීමට නිදහස ලබාදීම
(3) රජය සුබසාධක කටයුතුවල පමණක් නිරතවීම
(4) රජය නීතිය හා සාමය රැකීම (.........)

19. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය අපේක්ෂා කරනු ලබන රටවල් පමණක් දැක්වෙන පේළිය මින් කුමක් ද?
(1) ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, බ්‍රසීලය, ජපානය
(2) බ්‍රසීලය, ඉන්දියාව, දකුණු අප්‍රිකාව, ජපානය
(3) කැනඩාව, ජපානය, බ්‍රසීලය, ඉන්දියාව
(4) ආර්ජෙන්ටිනාව, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, ජපානය (.........)

20. තරුණ සිරකරුවන් වෙනුවෙන් ආරම්භ කරන ලද සුනීත පාසල පිහිටා ඇත්තේ
(1) මහරගම ය. (2) හෝමාගම ය. (3) වටරැක ය. (4) වැලිකඩ ය. (.........)

21. ශ්‍රී ලංකාවේ පළමු එළිමහන් සිරකඳවුර පිහිටුවා ඇත්තේ
(1) මීගස්තැන්නේ ය. (2) පල්ලෙකැලේ ය. (3) වීරවිල ය. (4) කුරුවිට ය. (.........)

22. වර්තමානයේ ශ්‍රී ලංකාවේ බන්ධනාගාර හා සම්බන්ධ වඩාත්ම නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?
(1) මත්ද්‍රව්‍ය භාවිතය සියලු සිරකරුවන් අතර ප්‍රචලිතවී ඇත.
(2) බොහොමයක් සිරගෙවල් අධික තදබදයෙන් යුක්ත ය.
(3) සිරකරුවන්ගේ පෝෂණ මට්ටම ඉතා අඩු ය.
(4) සෑම සිරගෙයක් ම ජනාකීර්ණ නගරයක පිහිටුවා ඇත. (.........)

[ 4 වැනි පිටුව බලන්න.

For More Government Jobs, Gazette, Past Papers and Application forms
Please Visit : **www.tamilguru.lk** | Contact us: tamilguru.lk@gmail.com



23. ශ්‍රී ලංකාවේ විදුලිබල නිෂ්පාදනය සම්බන්ධයෙන් දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණය මින් කුමක් ද?
   (1) ජල විදුලිය මගින් විදුලිය නිෂ්පාදනයේ සාපේක්ෂ දායකත්වය අඩුවෙමින් පවතී.
   (2) සුළං හා සූර්යකෝෂ මගින් විදුලිබල නිෂ්පාදනයට ප්‍රමුඛස්ථානය දී ඇත.
   (3) කුඩා පරිමාණ ජලවිදුලි බලාගාරවලින් වැඩි විදුලි බලධාරිතාවක් නිපදවීමට සැලසුම්කොට ඇත.
   (4) වර්තමානයේදී ශ්‍රී ලංකාවේ විදුලිබලය නොලැබෙන නිවාස සංඛ්‍යාව 20% ක් පමණ වේ. (.........)

24. ශ්‍රී ලංකාවේ පැරණිතම දේශපාලන පක්ෂය වන්නේ
   (1) එක්සත් ජාතික පක්ෂයයි.
   (2) ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයයි.
   (3) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.
   (4) ලංකා සමසමාජ පක්ෂයයි. (.........)

25. ශ්‍රී ලංකාව අධ්‍යාපනයට යොදවන මුදල දළ ජාතික ආදායමින් 1.8 ප්‍රතිශතයකි. නව රජයේ අතුරු අයවැය ලේඛනය අනුව අධ්‍යාපනය සඳහා යෙදවීමට යෝජිත මුදල් ප්‍රමාණය දළ ජාතික ආදායමෙන් කුමන ප්‍රතිශතයක් ද?
   (1) 3 (2) 4 (3) 5 (4) 6 (.........)

● අංක **26** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති තිත් ඉර මත ලියන්න.

26. පරිසරය සම්බන්ධයෙන් වූ "3R සංකල්පය" යටතේ අදහස් වන එක් කරුණක් දක්වන්න.

.......................................................................................................

27. මැරතන් තරගයක දුර සැතපුම් කොපමණ ද?

.......................................................................................................

28. මිනිස් සිරුරේ විෂද්‍රව්‍ය ඉවත් කරනු ලබන ඉන්ද්‍රිය කුමක් ද?

.......................................................................................................

29. ලෝකයේ මිල අඩුම ඉන්දියානු නිෂ්පාදනයක් වන පරිගණක චිපය (Chip) කුමන නමකින් හැඳින්වේද?

.......................................................................................................

30. මත්පැන් භාවිතය සම්පූර්ණයෙන් තහනම් කළ සාර්ක් කලාපීය රට කුමක් ද?

.......................................................................................................

31. 'කළු සල්ලි (Black money)' යනු මොනවා ද?

.......................................................................................................

32. සිරකරුවන් සඳහා භාවනා වැඩ සටහන් නිරතුරුවම පවත්වනු ලබන ආසියාතික රට කුමක් ද?

.......................................................................................................

33. දෙමළ, ඉංග්‍රීසි හා රුසියානු භාෂාවලට පරිවර්තනය කරන ලද සිංහල ළමා නවකථාව නම් කරන්න.

.......................................................................................................

34. ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ගම්මානය පිහිටුවා ඇත්තේ කොහි ද?

.......................................................................................................

35. තම නිවැසියන් සමග ගත කිරීමට අවසර ලබා ගැනීම සඳහා සිරකරුවකු විසින් සම්පූර්ණ කළයුතු ප්‍රධාන නීතිමය කොන්දේසිය කුමක් ද?

.......................................................................................................

36. ඒක පුද්ගල ආදායම වැඩිම ආසියානු රට නම් කරන්න.

.......................................................................................................

[ 5 වැනි පිටුව බලන්න.

37. මානව හිමිකම් දැක්වෙන්නේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමන පරිච්ඡේදය යටතේ ද?

.................................................................................................................................................

38. 'එක පාසලක් විවෘත කිරීමෙන් සිරගෙවල් දහසක් වැසිය හැකිය.' මෙම ප්‍රකාශය කරනු ලැබූ ප්‍රංශ ලේඛකයා කවුරුන් ද?

.................................................................................................................................................

39. ලෝකයේ විශාලතම මුස්ලිම් ජනගහනය ජීවත්වන රට කුමක් ද?

.................................................................................................................................................

40. ලොව වැඩිම පිරිසක් නරඹනු ලබන ජනප්‍රියතම ක්‍රීඩාව කුමක් ද?

.................................................................................................................................................

41. ලෝකයේ පළමුවරට රෝද දෙකේ අත්ට්‍රැක්ටරය නිපදවූ සුප්‍රකට ශ්‍රී ලාංකීය විද්‍යාඥයා කවුරුන් ද?

.................................................................................................................................................

42. ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ යෞවනයන්ට රැකියා ලබාදීමේ අරමුණින් මෑතකදී කර්මාන්තපුරයක් අරඹා ඇත්තේ කුමන ස්ථානයේ ද?

.................................................................................................................................................

43. ශ්‍රී ලංකාවේ මහා මාර්ග විදුලි සංඥා පද්ධති නිර්මාණය හා සංවර්ධනය කරනු ලබන විශ්ව විද්‍යාලය නම් කරන්න.

.................................................................................................................................................

44. යහපත් සෞඛ්‍ය තත්ත්වයක් පවත්වා ගැනීමට නීරෝගී පුද්ගලයකු විසින් දිනකට පානය කළ යුතු පානීය ජල ප්‍රමාණය ලීටර කොපමණ වේ ද?

.................................................................................................................................................

45. ශ්‍රී ලංකාවේදී ඩොල්ෆින් මසුන් වඩාත්ම බහුල ලෙස නැරඹිය හැකි මුහුදු තීරය කුමක් ද?

.................................................................................................................................................

46. වර්තමානයේ බැංකු කටයුතු පහසුව සඳහා යොදාගනු ලබන ජනප්‍රිය සන්නිවේදන උපකරණය කුමක් ද?

.................................................................................................................................................

47. නව නිපැයුම් සඳහා අනුග්‍රහය ලබාදෙන ශ්‍රී ලාංකීය කොමිෂන් සභාව නම් කරන්න.

.................................................................................................................................................

48. ඇම්.සී සිද්දි ලෙබ්බේතුමා ශ්‍රී ලංකාවේ කවර ක්ෂේත්‍රයක උන්නතිය සඳහා ක්‍රියා කළේ ද?

.................................................................................................................................................

49. බෞද්ධ කොඩිය නිර්මාණයට පුරෝගාමී වූ ඇමරිකානු ජාතිකයා කවුරුන් ද?

.................................................................................................................................................

50. ශ්‍රී ලංකාවට නිදහස දිනා ගැනීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ ශ්‍රී ලාංකීය දමිළ නායකයා නම් කරන්න.

.................................................................................................................................................

***

For More Government Jobs, Gazette, Past Papers and Application forms
Please Visit : **www.tamilguru.lk** | Contact us: **tamilguru.lk@gmail.com**

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ II වන පෙළ ජේලර්වරුන් හා II වන පෙළ පුනරුත්ථාපන නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014 (2015)

## (03) එකතු කිරීම ඇතුළු ගණිතය

පැ එකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඔබේ විභාග අංකය මෙහි ඇති තිත් ඉර මත ලියන්න.

..................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

..................................

වැදගත් :

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **02** කින් හා පිටු **04** කින් යුක්ත වේ. ***I*** කොටස ප්‍රශ්න **04** කින් ද, ***II*** කොටස ප්‍රශ්න **06** කින් ද සමන්විතය.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය එකකි.
* ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
* දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.
* ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.
* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
* මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
* අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

### පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| කොටස | පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|---|
| I | 2 | 1 - 4 | |
| II | 3 | 5 - 7 | |
| | 4 | 8 - 10 | |
| එකතුව | | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

| 2 වැනි පිටුව බලන්න.

For More Government Jobs, Gazette, Past Papers and Application forms
Please Visit : **www.tamilguru.lk** | Contact us: tamilguru.lk@gmail.com



## I කොටස

**1.** හරහටත් පහළටත් එකතු කර අවසාන පිළිතුර මගින් නිරවද්‍යතාව තහවුරු කරන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 207 | + | 103 | + | 568 | + | 222 | = | ........... |
| 445 | + | 335 | + | 179 | + | 104 | = | ........... |
| 318 | + | 72 | + | 205 | + | 48 | = | ........... |
| ......... | + | ......... | + | ......... | + | ......... | = | ........... |

(ලකුණු 16 යි)

**2.** හරහට එකතු කරන්න. පහළට අඩු කරන්න. අවසාන පිළිතුර මගින් නිරවද්‍යතාව තහවුරු කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 1078 | + | 222 | + | 500 | = | ........... |
| − | 179 | + | 123 | + | 399 | = | ........... |
| | ......... | + | ......... | + | ......... | = | ........... |

(ලකුණු 12 යි)

**3.** ධාරිතාව ලීටර 2.2 ක් වන බෝතලයක ජලය මිලිලීටර 950 ක් ඇත. එයට තවත් ජලය මිලිලීටර 950 ක් පිරවූ පසු බෝතලය සම්පූර්ණයෙන්ම පිරවීමට අවශ්‍ය ජල පරිමාව මිලිලීටරවලින් කොපමණ ද?

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(ලකුණු 06 යි)

**4.** බිස්කට් 24 බැගින් ඇති පැකට් 6 කින් බිස්කට් 34 ක් කෑමට ගන්නා ලදී. ඉතිරි බිස්කට් ප්‍රමාණය, පැකට් එකකට බිස්කට් 22 බැගින් වන සේ අසුරන ලදී. එවිට සෑදිය හැකි බිස්කට් පැකට් ගණන කීය ද?

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(ලකුණු 06 යි)

| 3 වැනි පිටුව බලන්න.

For More Government Jobs, Gazette, Past Papers and Application forms
Please Visit : **www.tamilguru.lk** | Contact us: tamilguru.lk@gmail.com



## II කොටස

**5.** එක්තරා ආයතනයක දිනකට වැඩ කළයුතු සාමාන්‍ය පැය ගණන අටකි. දිනකට වැඩ කළ හැකි උපරිම අතිකාල පැය ගණන දෙකකි. එම ප්‍රමාණය ඉක්මවා සේවය කළ ද වැඩිපුර අතිකාල පැයවලට ගෙවනු නොලැබේ. මිනිසකු සතියේ දින 5 ක් තුළ වැඩ කළ පැය ප්‍රමාණ පිළිවෙළින් පැය 10, 11, 9, 13, 12 ක් වශයෙන් විය. සාමාන්‍ය පැයකට රු. 80 ක් ද, අතිකාල පැයකට රු. 100 ක් ද ගෙවනු ලබයි නම්, එම සතියේ ඔහු ලබන මුළු ආදායම කොපමණදැයි සොයන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

*(ලකුණු 10 යි)*

**6.** එක්තරා තනතුරක් සඳහා නියමිත ආරම්භක මාසික වැටුප රු.16 000 කි. එම වැටුප රු.250 බැගින් වර්ෂ 7ක්ද රු.300 බැගින් වර්ෂ 10 ක් ද වශයෙන් වූ වාර්ෂික වැටුප් වර්ධකවලින් පසු රු.20 750ක අවසාන වැටුප් පියවරට එළඹේ. මෙම තනතුරට පත්වූ අයෙකු සේවය ආරම්භ කර කොපමණ වසර ගණනකට පසු ඔහුට රුපියල් 20 000 ඉක්ම වූ වැටුපක් ලැබිය හැකිදැයි සොයන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

*(ලකුණු 10 යි)*

**7.** එක්තරා ජල ටැංකියක් පිරවීම සඳහා ජල කරාම දෙකක් භාවිත කරනු ලැබේ. පළමු කරාමය පමණක් විවෘත කළ විට ටැංකිය පිරවීමට පැය 6 ක් ගත වේ. දෙවන කරාමය පමණක් විවෘත කළවිට ටැංකිය පිරවීමට පැය 3 ක් ගත වේ. ජල කරාම දෙකම එකවර විවෘත කර තැබුවහොත් ටැංකිය පිරවීමට කොපමණ පැය ගණනක් ගත වේ දැයි සොයන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

*(ලකුණු 10 යි)*

| 4 වැනි පිටුව බලන්න.

**8.** ක්‍රීඩකයන් 100 දෙනෙකු සහභාගි වන දින 3 ක පුහුණු කඳවුරක් සඳහා ඇස්තමේන්තු ගත වියදම් ලේඛනය මෙසේය.

- උදේ ආහාරය සඳහා දිනකට රු. 8 000
- දිවා ආහාරය සඳහා දිනකට රු. 18 000
- රාත්‍රී ආහාරය සඳහා දිනකට රු. 18 000
- අතුරුපස හා තේ සඳහා දිනකට රු. 5 000
- වෙනත් වියදම් සඳහා දිනකට රු. 3 500

මේ අනුව කඳවුරට සහභාගි වන එක් ක්‍රීඩකයකු වෙනුවෙන් දිනකට වෙන් කළයුතු මුදල කොපමණ ද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(ලකුණු 10 යි)

**9.** මෝටර් රථයක් A නගරයේ සිට B නගරයටත් එතැන් සිට C නගරයටත් පැයට කිලෝමීටර 50 ක ඒකාකාර වේගයෙන් පැය 5 කදී ගමන් කරයි. තවත් මෝටර් රථයක් A නගරයේ සිට B නගරයට පැයට කිලෝමීටර 40 ක ඒකාකාර වේගයෙන් පැය 4 කදී ගමන් කරයි. ඒ අනුව පැයට කිලෝමීටර 30 ක ඒකාකාර වේගයෙන් ගමන් කරන මෝටර් රථයකට B නගරයේ සිට C නගරයට යෑමට කොපමණ කාලයක් ගත වේ ද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(ලකුණු 10 යි)

**10.** භාණ්ඩයක් රු. 204 කට විකිණීමෙන් වෙළෙන්දෙකුට 15% ක පාඩුවක් සිදු වේ. 15% ක ලාභයක් ලැබීමට නම්, ඔහු එය කවර මුදලකට විකිණිය යුතු ද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(ලකුණු 10 යි)

***